# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1420/5– 2005 නොවැම්බර් 21 වැනි සඳුදා – 2005.11.21

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී.බී. 11/80(ii).

### 1980 අංක 26 දරන ආහාර පනත

1980 අංක 26 දරන ආහාර පනතේ 32 වන වගන්තිය යටතේ ආහාර උපදේශක කමිටුව විමසා සෞඛ්‍ය, පෝෂණ සහ ඌව වෙල්ලස්ස සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

නිමල් සිරිපාල ද සිල්වා,
සෞඛ්‍ය, පෝෂණ සහ ඌව වෙල්ලස්ස සංවර්ධන අමාත්‍ය.

2005 නොවැම්බර් මස 15 වන දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග ආහාර (ප්‍රකිරණ) නියෝග 2005 යනුවෙන් හඳුන්වනු ලබන අතර 2006 මැයි 01 දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

I වන කොටස

*සාමාන්‍ය විධිවිධාන*

2. මේ නියෝගවල විධිවිධාන–

(අ) ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද සෑම ආහාර ප්‍රකිරණ පහසුකමකටම ;

(ආ) දේශීය පරිභෝජනය සඳහා නැතහොත් අපනයනය සඳහා දේශීය වශයෙන් නිෂ්පාදිත සියලු ප්‍රකිරණිත ආහාර සම්බන්ධයෙන්; සහ

(ඇ) ආනයනික සියලු ආහාර සම්බන්ධයෙන් අදාළ කරගනු ලැබිය යුතු ය.

3. සෞඛ්‍ය සුරක්ෂිතභාවය සහ පරිසරයට අහිසි අවදානමක් නොවන පරිදි ආහාර ප්‍රකිරණය කිරීමේ නියමයන් සිදුකර ඇති බව තහවුරු කිරීම මෙම නියෝගවල ප්‍රධාන පරමාර්ථය වේ.

1A – CM 007526 – 1,000 (2007/05)

(අ) ආහාර තුළ රෝග කාරක ක්ෂුද්‍රජීවීන් සහ පරපෝෂිතයන් පාලනය කිරීම ;

(ආ) කෘමීන්, ක්ෂුද්‍රජීවීන් සහ ශාරීරික ක්‍රියාමාර්ග මගින් සිදුකල හැකි පශ්චාත් අස්වනු හානිය අඩු කිරීම ;

(ඇ) වෙළෙඳාමට අදාළ නිරෝධායන අවශ්‍යතාවයන් සපුරාලීම ;

(ඈ) ආහාරවල වෙළඳ හැකියාව විස්තාරණය කිරීම ;

(ඉ) ප්‍රකිරණ පහසුකම් තුළ ආරක්ෂාකාරී මෙහෙයුම් තහවුරු කිරීම.

4. (1) අනුමත නිෂ්පාදන ක්‍රියාවලියක් භාවිත කිරීම මගින් ප්‍රකිරණය කිරීමෙන් යම් ආහාරයකින් ප්‍රතිලාභ ලැබිය හැකි යයි ප්‍රත්‍යක්ෂ වන්නා වූ, ආහාර ප්‍රකිරණය සඳහා නිසි බලය ඇති ජාතික අධිකාරිය විසින් අනුමත කරන ලද සහ අවසර ලත් හෝ බලයලත් ආහාර ප්‍රකිරණ උපක්‍රමයකින් හැර කිසිදු ආහාරයක් ප්‍රකිරණයට භාජනය කර නොගත යුතු ය.

(2) මේ නියෝගවල II වන කොටසේ විධිවිධානවලට අනුව සහ යම් ආහාර වර්ගයකට අදාළව නිකුත් කරන ලද ප්‍රකිරණ බලපත්‍රයකට අනුකූලව ආහාර අයනීකරණ විකිරණ ක්‍රියාවලියකට භාජනය කළ යුතු ය.

5. අංක 560/13 දරන 1989 ජුනි මස 2 වන දින අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 1988 දරන සෞඛ්‍යාරක්ෂිත ආහාර (පොදු) නියෝග මගින් නියම කරන ලද පරිදි තත්ත්වය සහ සෞඛ්‍යාරක්ෂිත පොදු නියමයන්ට අනුකූලව නිෂ්පාදිත ආහාර මිස කිසිදු ආහාරයක් අයනීකරණ විකිරණ ක්‍රියාවලියකට භාජනය නොකල යුතු ය.

6. කිසියම් ආහාරයක් වෙනුවෙන් යොදන අයනීකරණ ප්‍රකිරණය අවම මට්ටමකින් පැවතිය යුතු අතර එම ක්‍රියාවලියෙන් ආහාර වල තත්ත්වය හීනවීම කෙරෙහි කිසියම් බලපෑමක් ඇතිවිය හැකි උපරිම මට්ටමට වඩා වැඩි නොවිය යුතු ය.

7. ප්‍රකිරණ ආහාර ඇසුරුම් කිරීම සඳහා භාවිතා කරන ඇසුරුම් ආම්පන්න ප්‍රකිරණය සඳහා සුදුසු විය යුතු අතර යලි ආසාදන සහ යලි දූෂිතවීම් වැළැක්වීමට ප්‍රමාණවත් විය යුතු ය. ගබඩා කිරීමේදී, ප්‍රවාහනය කිරීමේදී, බෙදා හැරීමේ දී ආහාර නිෂ්පාදන අලෙවිය සඳහා ඉදිරිපත් කිරීමේදී එම ඇසුරුම් ද්‍රව්‍ය ඒවායේ නිසි තත්ත්වය පවත්වාගෙන යාමට හැකි විය යුතු ය.

8. යම් ආහාරයක්,

(අ) ඒ ආහාරයට අදාළව, නිකුත් කරන ලද ප්‍රකිරණ බලපත්‍රයේ නියමයන්ට අනුකූලව ශ්‍රී ලංකාවේදී අයනීකරණ ප්‍රකිරණ ක්‍රියාවලියට ලක්කර ගත් යම් ආහාරයක් නම් මිස ;

(ආ) මෙම නියෝගවල VII වන කොටසේ විධිවිධානවලට අනුකූලව ආනයනය කරනු ලැබූ යම් ආහාරයක් නම් මිස ; හෝ

(ඇ) මෙම නියෝගවල V වන කොටසේ විධිවිධානවලට අනුකූලව ලේබල් කල ආහාරයක් නම් මිස, කිසිදු තැනැත්තකු විසින් අයනීකරණ ප්‍රකිරණයට යටත් කරනු ලැබ ඇති කිසියම් ආහාරයක් හෝ එවැනි යම් ආහාරයකින් කොටසක් විකිණීම සඳහා හෝ ප්‍රවාහනය සඳහා හෝ අලෙවිය සඳහා ගබඩාකර තැබීම හෝ අලෙවිය සඳහා ඉදිරිපත් කිරීම නොකළ යුතු ය.

## II *වන කොටස*

### *ආහාර අයනීකරණ විකිරණ ක්‍රියාවලියට භාජනය කිරීම*

9. ආහාර ප්‍රකිරණ පහසුකම්වලට සහ මාත්‍රා මිනුම්වලට අනුකූලවිය යුතු කොන්දේසි පහත දැක්වෙන පරිදි විය යුතු ය.

(අ) අයනීකරණ විකිරණය සඳහා ආහාර ප්‍රකිරණ පහසුකම් යොදාගන්නා සෑම අවස්ථාවකදී ම සේවකයන්ගේ, මහජනතාවගේ සහ පරිසරයේ ආරක්ෂාව තහවුරු කරන අයුරින් නිර්මාණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම කරනු ලැබිය යුතු ය.

(ආ) ආහාර ප්‍රකිරණ ක්‍රියාවලිය සඳහා බලය ලබා ඇති ප්‍රකිරණ පහසුකම, දේශීය නීතියට සහ නියෝගවලට අනුකූල විය යුතු ය.

(ඇ) ක්‍රියාවලිය පිළිබඳ නිසි වර්තා තබා ගැනීම සහ අවශ්‍ය පූර්වාරක්ෂක ක්‍රියාමාර්ග ගැනීම ඇතුළුව ජාතික සහ අන්තර්ජාතික වශයෙන් අනුගමනය කරන යහපත් ප්‍රකිරණ පිළිවෙත් ස්ථාපිත කර ඇති බව තහවුරු කරගැනීමට, ජාතික ආහාර ප්‍රකිරණ අධිකාරිය විසින් ප්‍රකිරණ පහසුකම් පරීක්ෂා කර බලනු ලැබිය යුතු ය.

(ඈ) මාත්‍රා මිනුම් තත්ව තහවුරු ක්‍රමයේ කොටසක් වන අතර පිළිගත් ජාතික සහ අන්තර්ජාතික පිළිවෙත්වලට අනුකූල විය යුතු ය.

(ඉ) ප්‍රකිරණ පහසුකම් ක්‍රියාකරවීම සහ පාලනය කිරීම නිලබලය ඇති ජාතික ආහාර ප්‍රකිරණ අධිකාරිය පිළිගත් අධ්‍යාපන පාඨමාලාවක් සාර්ථකව නිමකල, පුහුණු හා ප්‍රවීණ පුද්ගලයන් විසින් කරනු ලැබිය යුතු ය.

(ඊ) ආහාර ප්‍රකිරණ පහසුකම්, පරමාණුක බලශක්ති අධිකාරිය විසින් කලින් කලට නිකුත් කරනු ලබන විකිරණ ආරක්ෂණ නියෝගවලට අනුකූල විය යුතු ය.

(උ) යම් ආහාර ප්‍රකිරණ පහසුකමක් ක්‍රියාකරුවන් හෝ තත්ව පාලනය කරන පුද්ගලයන් විසින්, පහත විස්තර කර ඇති ආකාරයට මාත්‍රා මිණුම් පවත්වා ගනු ලැබිය යුතු ය :—

(i) ජාතික ආහාර ප්‍රකිරණ අධිකාරිය විසින් අනුමත කළ ආකාරයට ප්‍රකිරණ ක්‍රියාවලියට භාජනය කරන ලද ආහාරවලට අවශෝෂණය කරගත් මාත්‍රා ප්‍රමාණය සහ ව්‍යාප්ත වූ මාත්‍රා ප්‍රමාණය නිතිපතා ගණනය කිරීම ;

(ii) ප්‍රකිරණ පහසුකම් භාවිතයේ දී මිණුම් රටාවල හෝ සුපරීක්ෂණ උපක්‍රමවල ප්‍රතිචාරය ක්‍රමාංකනය කිරීම සඳහා මාත්‍රා මිනුම් නිවැරදිව සටහන් කිරීමට සෑුදු ප්‍රවේශ පවත්වාගෙන යාම සහ නොවරදින සේ සකස් කිරීම ;

(iii) නියමිත, උචිත සහ කාර්යක්ෂම මාත්‍රා මිනුම් හෝ සුපරීක්ෂණය සැපයීම පිණිස තෝරාගත් නිර්නායක නියමිත මාත්‍රා මිණුම් හා අනුකූල වීම ;

(iv) නිවරද්‍ය මාත්‍රා මිණුම් වාර්තා තබාගෙන, පවත්වාගෙන යාම සහ මාත්‍රා මිණුම් ක්‍රියවලියේ සෑම පියවරකදීම නිරීක්ෂණ වාර්තා කිරීම.

## III වන කොටස

### *ආහාර ප්‍රකිරණය පාලනය කිරීම*

10\. (1) ස්වාධීන බාහිර විගණන කටයුතු කරගෙන යනු ලැබීම සඳහා සහාය පිණිස ශ්‍රී ලංකාවේ ස්ථාපිත ආහාර ප්‍රකිරණ උපක්‍රමවල ලේඛනගත කරන ලද තත්ත්ව පාලන ක්‍රමයක් තිබිය යුතු ය ;

(2) ප්‍රකිරණය කළ යුතු ආහාර සහ ඒවායේ ඇසුරුම් ආම්පන්න පිළිගත හැකි සෞඛ්‍යාරක්ෂිත කොන්දේසිවලින් සහ මේ කාර්යය සඳහා ප්‍රමාණවත් වන පරිදි සුදුසු තත්වයකින් පැවතිය යුතු ය ;

(3) අයනීකරණ විකිරණයට භාජන කරන්නා වූ සියලු ආහාර නිෂ්පාදන,ප්‍රකිරණයට පෙර, ඒ අතරතුරදී සහ ඉන් පසුව යම් ප්‍රතිකර්මයක විශේෂ නියමයන් සැලකිල්ලට ගනිමින් පිළිගත් යහපත් නිෂ්පාදන පිළිවෙත්වලට අනුකූලව පවත්වාගෙන යා යුතු ය;

(4) ඇතුළතට එළඹෙන ආහාර නිෂ්පාදන පිටතට නික්මෙන ප්‍රකිරණය කළ ආහාර නිෂ්පාදන වලින් භෞතික වශයෙන් වෙන්කරනු ලැබිය යුතු ය. අදාළ අවස්ථාවලදී ප්‍රකිරණිත සහ ප්‍රකිරණිත නොවන ආහාර නිෂ්පාදන හඳුනාගැනීම පහසු කිරීමට හැකි කරවන දෘෂ්‍ය වර්ණ විපරිත විකිරණ දර්ශකයක් එක් එක් ඇසුරුම්වල පිට පැත්තේ අලවනු ලැබිය යුතු ය ;

(5) නිසි මාත්‍රා මිණුම් ක්‍රියාවලියක් ඇතුළුව, ලෝක සෞඛ්‍ය සංවිධානයේ ආහාර ප්‍රකිරණයට සම්බන්ධ ජාත්‍යන්තර උපදේශක කමිටුවක් (ICGFI) විසින් නිර්දේශිත යහපත් ප්‍රකිරණ පිළිවෙත්වලට අනුකූලව ප්‍රකිරණය කරගෙන යනු ලැබිය යුතු ය. පිළිගත් ජාතික සහ අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූල වන ලෙස මාත්‍රා මිණුම් ලකුණු කරණය කළ යුතු ය ;

(6) ප්‍රකිරණයට යටත් වන්නා වූ එක් එක් ආහාර කාණ්ඩවල වාර්තාවක් ප්‍රකිරණ උපක්‍රම මගින් පවත්වාගෙන යා යුතු ය. එම වාර්තාවල–

(අ) කාණ්ඩයේ අනුඅංකය ;

(ආ) ප්‍රකිරණ ක්‍රියවලිය කරන ලද දිනය ;

(ඇ) ප්‍රකිරණය කරන ලද ආහාර කාණ්ඩයේ වර්ගය සහ ප්‍රමාණය ;

(ඈ) අදාළ අවස්ථාවලදී ප්‍රකිරණ ප්‍රතිකර්මවල දී භාවිත කරනු ලබන ඇසුරුම් වර්ගයේ නම ;

(ඉ) විශේෂයෙන් අවශෝෂනය කරගන්නා ලද අවම සහ උපරිම මාත්‍රා ප්‍රමාණයට අදාළව ප්‍රතිකර්මවල දී යොදාගන්නා ලද සියලු සීමා සහ මිනුම් ;

(ඊ) ප්‍රකිරණ ප්‍රතිකර්මලදී නිරීක්ෂණය කරන ලද යම් සිදුවීමක් හෝ විචලනයක් ;

අඩංගු කළ යුතු ය.

(7) (5) වන ජේදය යටතේ පවත්වාගෙන යන වාර්තා ප්‍රකිරණ පහසුකම් මගින් අවම වශයෙන් අවුරුදු පහක කාලයක් සඳහාවත් තබා ගත යුතු අතර ප්‍රකිරණ පහසුකම නිමා කිරීමේ දී ඒවා බලපත්‍ර නිකුත් කරන ලද අධිකාරියට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(8) සෑම ප්‍රකිරණ පහසුකමක් විසින් ම පහත දැක්වෙන කරුණු අඩංගු වූ ලිඛිත වාර්තාවක් වාර්ෂිකව නිසි බලය ඇති ජාතික අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු ය.

(අ) ආහාර ප්‍රකිරණ උපක්‍රමයේ නාමය ;

(ආ) වාර්තාව බලපාන කාලසීමාව ;

(ඇ) එම කාලසීමාව තුළ අයනීකරණ ප්‍රකිරණ මගින් ප්‍රතිකර්මයට භාජනය කරන ලද එක් එක් ආහාර පිළිබඳ විස්තර ;

(ඈ) එම කාලසීමාව තුළ අයනීකරණ ප්‍රකිරණයට භාජනය කරන ලද එක් එක් ආහාරයේ පරිමාව හෝ බර අනුව ප්‍රමාණය.

(9) නිසි බලය ඇති ජාතික අධිකාරිය විසින් මෙම නියෝගවල විධිවිධාන බලාත්මක කළ යුතු අතර අවම වශයෙන් අවුරුද්දකට වරක්වත් ක්‍රමානුකූල පරීක්ෂණයක් කරගෙන යා යුතු ය.

(10) එම නියෝග ක්‍රියාත්මක කිරීමට අදාළ සෑම බලධරයකුටම, ආහාර ප්‍රකිරණය සඳහා හෝ අයනිකරණ විකිරණය මගින් ප්‍රතිකර්ම කරනු ලැබ ඇති හෝ ප්‍රතිකර්ම කරනු ලබන ආහාර ගබඩාකර ඇති, ඕනෑම ස්ථානයකට ප්‍රවේශවීමට අයිතිවාසිකම් තිබිය යුතු ය.

(11) අදාල සියලු ලේඛන සහ වාර්තා පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(12) නිසි බලය ඇති ජාතික අධිකාරිය නිශ්චිත කාර්යයන් සඳහා සාම්පල් ලබාගැනීමට අයිතිවාසිකමක් තිබිය යුතු ය.

## IV *වන කොටස*

### *ආහාර ප්‍රකිරණය සහ යහපත් ප්‍රකිරණ පිළිවෙත් සඳහා බලය දීම*

11. (1) ප්‍රකිරණය කරනු ලැබිය යුතු ආහාර, නිසි බලය ඇති ජාතික අධිකාරියෙන් විමසා සෞඛ්‍ය විෂයය භාර අමාත්‍යවරයා විසින් කලින් කලට නිශ්චය කරනු ලැබිය යුතු ය. අයනීකරණ විකිරණ මගින් ප්‍රතිකර්ම කරනු ලැබීමට බලය දෙන ලද ආහාර මෙම නියෝගවලින් I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති ඒවා විය යුතු ය.

(2) සමස්ත සාමාන්‍ය ප්‍රකිරණ මාත්‍රාව 10 MeV. වැඩි නොවිය යුතු ය.

(3) මාත්‍රා පද්ධතියේ ප්‍රමාණයකට අනුව ප්‍රකිරණය කරනු ලැබිය යුතු ආහාර සඳහා අවශ්‍ය කාර්මික අවශ්‍යතා ආහාරයෙන් ආහාරයට, අරමුණෙන් අරමුණට වෙනස් වේ. ප්‍රකිරණය කරනු ලැබීමට බලය දෙන ලද ආහාරවල අවම සහ උපරිම මාත්‍රා සීමාවන් මෙම නියෝගවල I වන උපලේඛනයේ දක්වා ඇති පරිදි විය යුතු ය. අවශෝෂනය කරගන්නා ලද මාත්‍රාව විශේෂයෙන් සෞඛ්‍යාරක්ෂිත හෝ නිරෝධායන කාර්යයන් සඳහා ආහාර ඉදිරිපත් කරන විට තාක්ෂණික අවශ්‍යතා මත පදනම්ව අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය කරන අවම ප්‍රමාණයකින් පැවතිය යුතුය. අවශෝෂනය කර ගන්නා ලද මාත්‍රාවල, නිෂ්පාදනයේ ස්වභාවික ගුණාත්මකභාවය රඳවා ගැනීමේ උපරිමයට අඩුවෙන් ද තිබිය යුතු ය.

## V වන කොටස

### ලේබල් කිරීම

12. අංක 1376/9 දරන 2005 ජනවාරි මස 19 වන දින දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද ආහාර (ලේබල් කිරීමේ සහ ප්‍රචාරය කිරීම) නියෝග 2005 විධිවිධානවලට අනුකූලව ප්‍රකිරණිත ආහාරයක් ලේබල් කරනු ලැබිය යුතු ය.

13. (1) පූර්ව ඇසුරුම්වලින් යුතුව හෝ එසේ නොමැතිව ප්‍රකිරණය කරන ලද ආහාර ආනයනය, කිරීම හෝ අපනයනය කිරීම සම්බන්ධයෙන් අදාළ නැව්ගත කිරීමේ ලේඛනවල, ආහාර ප්‍රකිරණය කරනු ලැබ ඇති ලියාපදිංචි ප්‍රකිරණ උපක්‍රම හඳුනාගැනීම පිණිස ප්‍රතිකර්ම කළ දිනය හෝ දිනයන් සහ කොටස් හඳුනා ගැනීමේ අංක පිළිබඳව නිවැරදි තොරතුරු දැක්විය යුතු ය.

(2) (අ) ප්‍රකිරණය කරන ලද ආහාර පූර්ව ඇසුරුම් බහාලුම්වල පමණක් විකිණීම සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ආ) අයනීකරණ විකිරණයකින් ප්‍රතිකර්ම කරනු ලැබ ඇති ආහාර අඩංගු ඇසුරුමකට අමුණන ලද ලේබලයක පහත දක්වා ඇති පරිදි, ජාත්‍යන්තර ආහාර ප්‍රකිරණ සංකේතය ඇතුළුව ආහාරයේ පොදු නාමයට ඉතා ආසන්න වශයෙන් වූ යම් ප්‍රතිකර්මයක් දක්වන ලිඛිත ප්‍රකාශයක් ද තිබිය යුතු ය.

(ඇ) ප්‍රකිරණය කරන ලද ආහාරවල සියලු ඇසුරුම්මත පහත දැක්වෙන ප්‍රතිඥාවක් සහ පාඨයක් සහ සළකුණක් අඩංගු කරනු ලැබිය යුතු ය.

| |
|---|
| ප්‍රකිරණය කළ ක්‍රමය |
| (නම) :—............................................................ |
| ප්‍රකිරණය කරන ලද දිනය :—.................................................. |
| බලපත්‍ර අංකය :—............................................................ |
| ප්‍රකිරණය කිරීමේ අරමුණ :—................................................ |

(ඈ) ප්‍රකිරණ නිෂ්පාදනයක් වෙනත් ආකාරයක සම්මිශ්‍රණයක් ලෙස භාවිත කරනු ලබන විට ඒ නිෂ්පාදනය සම්මිශ්‍රණ ලැයිස්තුවේ සඳහන් කරනු ලැබිය යුතු ය.

(ඉ) තනි සම්මිශ්‍රණ නිෂ්පාදනයක් ප්‍රකිරණය කරනු ලැබ ඇති අමු ද්‍රව්‍යයකින් සකස් කරනු ලැබ ඇති අවස්ථාවක ඒ නිෂ්පාදනයේ ලේබලයෙහි ප්‍රතිකර්මයේ ප්‍රකාශයක් අඩංගු කළ යුතු ය.

(3) තොග බහාලුවල ආහාර ආනයනය කිරීම හෝ අපනයනය කිරීම සම්බන්ධයෙන්, අදාළ නැව්ගත කිරීමේ ලේඛනවල, එම අඩංගු ද්‍රව්‍ය ප්‍රකිරණයට යටත් කරනු ලැබ ඇති බවට වූ ප්‍රකාශයක් අඩංගු කරනු ලැබිය යුතු ය.

(4) සෘජු පරිභෝජනය සඳහා අපේක්ෂිත ඇසුරුම් රහිත ආහාර සම්බන්ධයෙන් එම ආහාර ප්‍රකිරණය කරනු ලැබුවේ ද යන්න පිළිබඳ වූ තොරතුරු එම ආහාරය ආසන්නයේ ම ප්‍රදර්ශනය කළ යුතු ය.

## VI කොටස

### ප්‍රතිවිකිරණය කිරීම

14. (1) නිසි බලය ඇති ජාතික අධිකාරියෙන් විමසා සෞඛ්‍ය විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චිතව අවසර දී ඇත්නම් මිස වරක් ප්‍රකිරණය කරන ලද ආහාර ප්‍රතිප්‍රකිරණය කරනු නොලැබිය යුතු ය.

(2) මේ නියෝගවල කාර්යය සඳහා,

(අ) වෙනත් තාක්ෂණික කාර්යයන් සඳහා ප්‍රකිරණය කරනු ලැබ ඇති උදා : 1 kGy පමණ වන අඩු මාත්‍රා මට්ටමකින්ප්‍රකිරණය කරනු ලැබ ඇති ද්‍රව්‍ය වලින් ආහාර සකස් කර තිබීම ;

(ආ) ප්‍රකිරණය කරන ලද ආහාරවල ප්‍රකිරණ සම්මිශ්‍රණ 5 % ට වඩා අඩුවෙන් අඩංගු වන විට ; හෝ

(ඇ) අපේක්ෂිත බලපෑම අත්කර ගැනීමට අවශ්‍ය කරන මුළු අයනිකරණ විකිරණ මාත්‍රා ප්‍රමාණය, නිශ්චිත තාක්ෂණික කාර්යයන් සඳහා සකසන ලද කොටසක් ලෙස එක් වතාවකට වඩා වැඩි වාර ගණනකදී ආහාර වලට යොදාගෙන ඇති අවස්ථාවක,

ආහාර ප්‍රතිවිකිරණය කරනු ලැබ ඇති ලෙසින් සලකනු නොලැබිය යුතු ය.

(3) ප්‍රකිරණයට යටත් කළ ආහාර මගින් අවශෝෂනය කරගන්නා ලද මුළු මාත්‍රා ප්‍රමාණයේ සමුච්චිතය කෝඩෙක්ස් පොදු ප්‍රමිති මගින් නිර්දේශ කරන ලද ප්‍රකිරණය කරන ලද ආහාර සඳහා වූ පොදු ප්‍රමිතියේ සීමාව නොඉක්මවිය යුතු ය.

## VII වන කොටස

### ප්‍රකිරණය කරන ලද ආහාර ආනයනය කිරීම සහ අපනයන කිරීම

15. ප්‍රකිරණය කරන ලද ආහාර ආනයනය කිරීම සහ අපනයනය කිරීම මෙම නියෝගවල නියමන්ට අනුකූලව කරනු ලැබිය යුතු අතර නැව්ගත කිරීමේ ලේඛන .-

(අ) නිසි ලේබල් කිරීමේ ලේඛන වලින් ;

(ආ) ආහාර ප්‍රකිරණ පහසුකම් සඳහා අදාළ බවට වූ ලේඛනවලින් ; සහ

(ඇ) මූලාරම්භක දේශයේ නිසි බලය ඇති ජාතික අධිකාරිය විසින් ආහාර පරීක්ෂා කරනු ලැබ ඇති බවට වූ සහතිකයකින්,

සමන්විත විය යුතු ය.

16. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ නියෝගවල
"පනත" යන්නෙන්, 1980 අංක 26 දරන ආහාර පනත අදහස් වේ ;

"ආහාර" යන්නට මේ පනතේ ඒ සඳහා දෙනු ලැබ ඇති එම අර්ථයම තිබිය යුතු ය.

"අයනීකරණ විකිරණය" යන්නෙන්, පහත දක්වා ඇති පරිදි සෘජුව හෝ වක්‍රව විද්‍යුත් අණු නිපදවීමට හැකි ගැමා කිරණ, එක්ස් කිරණ හෝ අනුදේහ විකිරණ අදහස් වේ ;

(අ) ගැමා කිරණ $^{60}$Co හෝ $^{137}$Cs රේඩියෝ නියුක්ලයිඩ් මගින් ;

(ආ) 5 MeV ශක්ති මට්ටමක හෝ අවමව යන්ත්‍රානුසාරයෙන් නිෂ්පාදනය කරනු ලබන එක්ස් කිරණ ;

(ඇ) 10 MeV ශක්ති මට්ටමක හෝ අවමව යන්ත්‍රානුසාරයෙන් නිෂ්පාදනය කරනු ලබන ඉලෙක්ට්‍රෝන ;

"ආහාර ප්‍රකිරණ පහසුකම" යන්නෙන්, ආහාර ප්‍රකිරණ පිළිබඳ නිසි බලය ඇති ජාතික අධිකාරිය විසින් අනුමත කළ සහ බලපත්‍රලත් හෝ බලය දුන් පහසුකමක් අදහස් වේ ;

"ආහාර ප්‍රතිකිරණය" සඳහා වූ නිසිබලය ඇති ජාතික අධිකාරිය යන්නෙන්, 1969 අංක 19 දරන පරමාණුක බලශක්ති අධිකාරිය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති අධිකාරිය අදහස් වේ ;

"ප්‍රකිරණය කරන ලද ආහාර" යන්නෙන්, මෙම නියෝගවල I වන කොටසේ සඳහන් කරන ලද අරමුණු ඉටුකර ගැනීමට අයනීකරණ විකිරණය මගින් ප්‍රතිකර්මයකට භාජනය කරනු ලැබ ඇති ආහාර කිසිවක් අදහස් වන අතර ගණනය කිරීමේ සහ පරීක්ෂණ කිරීමේ කාර්යයන් සඳහා ප්‍රකිකරණයට භාජනය කරනු ලැබූ ආහාර ඇතුළත් නොවේ.

"මාත්‍රා මිණුම්" යන්නෙන් අයනීකරණ විකිරණයට භාජනය කරන ලද ආහාරවලින් ප්‍රකිරණයේ දී අවශෝෂනය කරගන්නා ලද මාත්‍රා ප්‍රමාණය ගණනය කිරීමට භාවිත කරන ක්‍රමයක් අදහස් වේ.

" උපදේශක මාත්‍රා සීමාවන් " යන්න, පොදු යහපත් නිෂ්පාදන පිළිවෙතක් යටතේ අයනීකරණ විකිරණයේ දී, එකී අපේක්ෂිත අරමුණු තහවුරු කරගැනීමට සහ ව්‍යතිරේක කරුණු යටතේ එම ප්‍රතිකර්මයට භාජනය වන්නා වූ ආහාරවල ස්වභාවික තත්වය රඳවා ගැනීමට අවශ්‍ය උපරිම සහ අවම මාත්‍රා ප්‍රමාණ වේ. (අත්කරගත යුතු පොදු යහපත් නිෂ්පාදන පිළිවෙත් සීමා සහ අපේක්ෂිත කාර්යවලදී, දී ඇති තොරතුරු සහ සුරක්ෂිතතාවය ප්‍රමාණවත් වුවද වෙනත් මාත්‍රා සීමාවන් ද භාවිත කරනු ලැබිය හැකි ය.)

"ප්‍රකිරණය කළ ආහාර" යන්නෙන්, තනිව හෝ සමාන ආහාර පද්ධතිය තුළ එක් එක් ආහාර කොටසකින් යම් කාණ්ඩයක කොටසක් ලෙස අයනීකරණ විකිරණය මගින් ප්‍රතිකර්මයට භාජනය කරනු ලැබ ඇති ආහාර කිසිවක් අදහස් වේ.

"ප්‍රකිරණ බලපත්‍ර" යන්නෙන්, කිසියම් පන්තියකට අයත් ආහාරයකට අයනීකරණ විකිරණය මගින් ප්‍රතිකර්ම කරනු ලැබීමට අයිතිකරුවකුට බලය දෙන්නා වූ බලපත්‍රයක් අදහස් වේ.

## I වන උපලේඛනය

### උපරිම සහ අවම ප්‍රකිරණ මාත්‍රා

[11(3) වන නියෝගය]

| I වන තීරය<br>අනුක්‍රමික අංකය | II වන තීරය<br>ආහාරවල නම් | III වන තීරය<br>ප්‍රමිතිකරණ මාත්‍රා (kGy) | | |
|---|---|---|---|---|
| | | අවම | උපරිම | මුළුප්‍රමාණය |
| 1. | ළූණු (ලොකු) | 0.03 | 0.09 | 0.06 |
| 2. | කුළුබඩු | 2 | 10 | 6 |
| 3. | අල | 0.06 | 0.15 | 0.10 |
| 4. | සහල් | 0.25 | 1.0 | 0.62 |
| 5. | රුලං, ආටාපිටි සහ පාන් පිටි | 0.25 | 01. | 0.62 |
| 6. | අඹ | 0.25 | 0.75 | 0.5 |
| 7. | වියළි මිදි, දිවුල් සහ වියළි රටඉඳි | 0.25 | 0.75 | 0.5 |
| 8. | ඉඟුරු සහ රතුළූණු | 0.03 | 0.15 | 0.09 |
| 9. | මස් සහ කුකුළු මස් අඩංගු මාංශ නිෂ්පාදන | 2.5 | 4.0 | 3.25 |

12-78

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.